## ශ්‍රී ලංකා ගුවන් හමුදාව

අංක 2245 දරන 2021 සැප්තැම්බර් මස 10 වැනි දින පළකරන ලද *රජයේ ගැසට්* නිවේදන සංශෝධනය කිරීම

1. වෘත්තීය/ශාස්ත්‍රීය සුදුසුකම් :

(අ) **විද්‍යුත් ඉංජිනේරු ශාඛාව**

(1) පර්යේෂණ නිලධාරි - පිරිමි/කාන්තා (ස්වේච්ඡා)

ගෲප් කැප්ටන්/විංග් කමාන්ඩර් - ප්‍රධාන ව්‍යාපෘති සම්බන්ධීකරණ නිලධාරි

මහාචාර්ය/ආචාර්ය මට්ටමේ සුදුසුකම්ලත් වෘත්තිකයින් විය යුතු අතර, ඉංජිනේරු භෞතික විද්‍යාව/ද්‍රව්‍යමය ඉංජිනේරු විද්‍යාව/පොලිමර් ඉලෙක්ට්‍රොනික විද්‍යාව/නැනෝ තාක්ෂණවේදය/රොබෝ තාක්ෂණවේදය සහ යාන්ත්‍ර ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු විද්‍යාව යන ක්ෂේත්‍රයන්හි අවම වශයෙන් අවුරුදු 5ක පළපුරුද්දක් තිබීම සහ ඉංජිනේරු ක්ෂේත්‍රයේ විෂය ධාරාවකින් දර්ශන ආචාර්ය (PhD) මට්ටම සම්පූර්ණව තිබීම.

ස්කොඩ්‍රන් ලීඩර් - ව්‍යාපෘති පරීක්ෂක නිලධාරි

ශාස්ත්‍රපති උපාධිධාරි මට්ටමේ සුදුසුකම් ලත් වෘත්තිකයින් විය යුතු අතර, විදුලි/ඉලෙක්ට්‍රොනික හා විදුලි සංදේශ ඉංජිනේරු, පිළිබඳ අවම වශයෙන් අවුරුද 5ක පළපුරුද්දක් තිබීම සහ ඉංජිනේරු විෂය ධාරාවක් මගින් ශාස්ත්‍රපති උපාධිය සම්පූර්ණව තිබීම.

2. මූලික සුදුසුකම් :

(අ) වයස : 2021 නොවැම්බර් මස 01 වැනි දිනට ස්කොඩ්‍රන් ලීඩර් - අවුරුදු 40ට නොවැඩි විය යුතුය.
ගෲප් කැප්ටන්/විංග් කමාන්ඩර් - අවුරුදු 50ට නොවැඩි විය යුතුය.

3. ඉල්ලුම්කරුවන්ට උපදෙස් :

(අ) පහත දැක්වෙන ආකෘති පත්‍රයට අනුව ඉල්ලුම්පතේ සියලුම කොටස් හැකි පමණ විස්තර හා පැහැදිලිව සම්පූර්ණ කළ යුතුය. ඉල්ලුම්පත් **2021 ඔක්තෝබර් මස 22 වැනි දින මධ්‍යාහ්න 12.00ට** හෝ ඊට පෙර ලැබෙන සේ **"විධායක ආධුනිකයින් බඳවා ගැනීමේ විධායක නිලධාරි, ආධුනිකයින් බඳවාගැනීමේ විධායක කාර්යාලය, ශ්‍රී ලංකා ගුවන් හමුදා වෘත්තීය පුහුණු පාසල, කොටුගොඩ"** යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. ඉල්ලුම්පත් බහාලන කවරයේ **"පර්යේෂණ නිලධාරි සඳහා ඉල්ලුම්පත"** යනුවෙන් සඳහන් විය යුතු අතර, ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට හා වේලාවට පසුව සහ මෙම නිවේදනයේ අවශ්‍යතාවයන්ට අනුකූල නොවන ඉල්ලුම්පත් සලකා බලනු නොලැබේ.

4. වැටුප් හා දීමනා :

(අ) ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ අධිකාරිලත් නිලධාරින්ගේ වැටුප් පහත සඳහන් පරිදි වේ.

| වසර / නිලය | 2021 (වාර්ෂිකව) රුපියල් |
|---|---|
| ස්කොඩ්‍රන් ලීඩර් | 731,580.00 - (22x16020) = 1,084,020.00 |
| විංග් කමාන්ඩර් | 751,140.00 - (17x19560) = 1,083,660.00 |
| ගෲප් කැප්ටන් | 914,100.00 - (17x26040) = 1,356,780.00 |

එස් කේ පතිරණ,
ඩබ්ලිව්ඩබ්ලිව්වී (දෙවරක්), ආර්ඩබ්ලිව්පී (දෙවරක්),
ආර්එස්පී (සිව්වරක්), වීඑස්වී, යූඑස්පී, එම්එස්සී (එම්ඕජ්)
යූඑස්ජ්, එම්එස්සී (ආරක්ෂක අධ්‍යයන) කළමනාකරණ,
එම්ෆිල් (ඉන්දියා), එම්අයිඑම් (ශ්‍රී ලංකා),
එන්ඩීසී (ඉන්දියා), පීඑස්සී, කිව්එෆ්අයි
එයාර් මාර්ෂල්
ගුවන් හමුදාධිපති

මූලස්ථානය,
ශ්‍රී ලංකා ගුවන් හමුදාව,
තැ.පෙ. 594
කොළඹ 02